තැන්පත් කරන ලද මුදල් ලබාගෙන ඇති බව තහවුරු වී ඇත. මෙම ගිණුමට වෙනත් හැටන් නැෂනල් බැංකු ශාඛාවලින් මුදල් බැරකර ඇති අතර, එකී මුදල් බැරකරන ලද පුද්ගලයා ලදුපතේ ඔහුගේ නමක් සඳහන් කර නොමැති බවද පෙනී යයි.

පොලිස් පරීක්ෂක තිශාන්ත පුෂ්පලාල් මීත් පසු සාක්ෂි දෙන ලදී. ඔහු 2006 අප්‍රියෙල් මාසයේ සිට 2008 සැප්තැම්බර් මාසය දක්වා ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයේ අංක 3 ට අනුයුක්තව පොලිස් පරීක්ෂක ජනකාන්ත යටතේ සේවය කර ඇත. 18.03.2008 වන දින වුදිත තිස්සනායගම්ගෙන් අනාවරණය වූ තොරතුරු මත කොළඹ 13, ජම්පටා විදියේ අංක 313 දරණ ස්ථානයේ පිහිටි අවුට්රීච් මල්ටිමීඩියා ප්‍රයිවට් ලිමිටඩ් සහ රෙනෙයිසන් පබ්ලිකේෂන්ස් ගැරන්ටි ලිමිටඩ් යන කාර්යාලයට විමර්ශනය සඳහා ගොස් ඇත. එම ස්ථානයට යන අවස්ථාවේදී ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශය භාරයේ සිටි ජෙසිකරන් යන අයද රැගෙන ගොස් ඇති අතර, එහි ඉබ් යතුරු දමා ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශය බාරයේ තිබී ඇත. එම ස්ථානයේ තිබී රෙනයිසන්ස් පබ්ලිකේෂන් විසින් මුද්‍රණය කරන ලද North Eastern Monthly සඟරා පිටපත් 50 ක් පමණ ඔහු අත්අඩංගුවට ගෙන ඇත. එම සඟරා ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයේ පරිගණක අංශයේ නිලධාරීන්ට පරීක්ෂා කිරීම සඳහා බාරදී ඇත. ඔහු විසින් අත්අඩංගුවට ගත්තා ලද 2006 ජූලි මාසයට අදාල සඟරාව <u>පැ.3</u> වශයෙන් ලකුණු කරන ලදී. එහි කර්තෘ වැකියේ මාතෘකාව වන "Providing security to Tamils now will define northeastern politics of the future?" යන්න <u>පැ.3(1)</u> ලෙසත්, එහි සඳහන් "It is fairly obvious that the government is not going to offer them any protection. In fact it is state

security forces that are the main perpetrator of the killings .යන කොටස පැ.3(1)අ වශයෙන්ද ලකුණු කරන ලදි.

03 SEP 2009

එම North Eastern Monthly සඟරාවලින් 2006 සැප්තැම්බර් මාසයට අදාල සඟරා පැ.4 ලෙස ලකුණු කරමින්, ඔහු අත්අඩංගුවට ගත් සඟරා ලෙසට හඳුනා ගන්නා ලදී. එහි පිටු අංක 16 යේ අඩංගු with no military options, government buys him by offering watered down devolution" යන ලිපිය තිස්සනායගම් විසින් ලියන ලද්දක් බව සඳහන් කරමින් එය පැ.4(අ) වශයෙන් ලකුණු කරන ලද අතර, එහි සඳහන් "such offensives against the civilians are accompanied by attempts to starve the population by refusing them food as well as medicines and fuel with the hope of driving out the people of Vaharai and depopulating it. As this story is being written Vaharai is being subject to intense shilling and aerial bombardment යන කොටස පැ.4(අ)1 ලෙස ලකුණු කරන ලදි.

මෙම සාක්ෂිකරු රිනේෂන්ස් ගැරන්ටි ලිමිටඩ් ආයතනය නමින් හැටන් නැෂනල් බැංකු ශාඛාවේ අළුත්කඩේ ශාඛාවේ පැවති 0010361214 නැමැති ගිණුම පිළිබඳව විමර්ෂණය කර ඇත. එහි සහකාර කළමණාකරුගේ ප්‍රකාශය සටහන් කර ගිණුමට අදාලව කරන ලද තැන්පතු සම්බන්ධයෙන් විමර්ෂණය කර ඇත. අළුත්කඩේ ශාඛාවේ කළමණාකරු ගුණරත්නගෙන් වාර්තාවක් ලබාගෙන ඇත. ඔහු ත්‍රස්තවාදී විමර්ෂණ කොට්ඨාශයට ලබා දුන් වාර්තාව පැ.2(8) මෙම සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලදී. මෙම North Eastern Monthly සඟරාව ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූලව ලියාපදිංචි කරන ලද සඟරාවක් නොවන බවට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ

03 SEP 2009

ලියවිලි පරීක්ෂා කිරීමේදී සාක්ෂිකරුට අනාවරණය වී ඇත. මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් වුදිත තිස්සනායගම් විසින් මුද්‍රණය කරන ලද North Eastern Monthly සඟරාව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ නීත්‍යානුකූල සඟරාවක් නොවන බවත්, එය චූදිත විසින් මුද්‍රණය කරන ලද්දක් බවත් තහවුරු වී ඇත. මෙම සාක්ෂිකරුගෙන් චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න අසමින් පැ.3(1) සහ පැ.4(1) ලියවිලිවල ඉංග්‍රීසි අර්ථය තේරුම් ගැනීමට හැකිද කියා ප්‍රශ්න කරන ලදි. මෙම සාක්ෂිකරු සාක්ෂි දීමට කැඳවන ලද්දේ එම ලිපිවල ඉංග්‍රීසි අර්ථය අධිකරණයට ඉදිරිපත් කිරීමට නොවන අතර, ඔහු කැඳවන ලද්දේ ඔහු එම සඟරා අත්අඩංගුවට ගැනීමත්, එම සඟරාව නීත්‍යානුකූලව ලියාපදිංචි කරන ලද සඟරාවක්ද කියා විමර්ශනය කිරීමත් සම්බන්ධයෙන් සාක්ෂි දීමට වන අතර මෙම හරස්ප්‍රශ්නවලින් ඔහුගේ සාක්ෂිය බිඳ හෙළීමට විත්තියට නොහැකි විය. මෙම විමර්ශණ නිලධාරියාගේ ඉංග්‍රීසි භාෂා දැනුම මෙම නඩුවට කිසි සේත් අදාල වන්නේ නැත.

ත්‍රස්තවාදි විමර්ශණ කොට්ඨාශයේ උප පොලිස් පරීක්ෂක **මොහොමඩ් රාසික් මින්** පසුව සාක්ෂි දෙන ලදී. මොහු පලපුරුදු පොලිස් නිලධාරියකු වන අතර, ත්‍රස්තවාදි විමර්ශණ කොට්ඨාශයේ අවුරුදු 10 කට අධික කාලයක් සේවය කර ඇත. ඔහු සිංහල භාෂාව, සාමාන්‍ය පෙළ විභාගයට විෂයක් ලෙස හදාරා ඇති අතර, සිංහල භාෂාව සාමාන්‍ය පෙළ විභාගයෙන් සමත් වී ඇත. දෙමළ භාෂාවද සාමාන්‍ය පෙළ විභාගයේදී විෂයක් ලෙස හදාරා ඇති අතර, සාමාන්‍ය පෙළ විභාගයේදී දෙමළ භාෂාවද සමත්වී ඇත. ඔහු සිංහල භාෂාවෙන් සාක්ෂි දුන් අතර, ඔහුට ඒ ගැන හොඳ දැනීමක් තිබූ බව අධිකරණය අධ්‍යානය කරන ලදී.

03 SEP 2009



මෙම සාක්ෂිකරු 07.03.2008 වන දින චූදිතගේ ප්‍රකාශයක් සටහන් කර ඇත. ත්‍රස්තවාදී විමර්ෂණ කොට්ඨාශයේ පොලිස් සටහන් පොතේ පිටු අංක 019734 බලමින් එහි ආරම්භයේදී පැය 17 යන්න වෙනස් කර ඇති බවත්, එය ඔහු විසින් කරන ලද්දක් නොවන බවත් පවසා සාමාන්‍යයෙන් වරදක් සාදන විට එය එක ඉරකින් කපා හරින බවත්, එසේ කර කෙටි අත්සනක් යොදන බවත්, මෙහි කපා හැරීම එසේ කර නොමැති බවත් කියා සිටින ලදී. එහි සියළුම සටහන් ඔහුගේ බවත්, කපා හරින ලද කොටස පමණක් වෙන කිසිවකු විසින් කරන ලද්දක් බවත් සාක්ෂිකරු කියා සිටින ලදී. 07.03.2008 වන දින ඔහු චූදිතයේ ප්‍රකාශය ලබා ගැනීම ආරම්භ කලේ පැය 19.00 ට පමණ බවත් ඔහු යොදන ලද සටහන් වෙනස් කර ඇති බවත් කියා සිටින ලදී. මෙම ප්‍රකාශය සටහන් කිරීම අවසන් කරන ලද්දේ පැය 23.30 ට බවත්, පසු දින පෙ.ව 9.30 ට නැවත එම ප්‍රකාශය ආරම්භ කල බවත්, චූදිත අත්අඩංගුවට ගත් හේතුව එහි සඳහන් කර ඇති බවත් චූදිතව අත්අඩංගුවට ගෙන ඇත්තේ 07.03.2008 වන දින බවත් කියා සිටින ලදී. පොලිස් පරීක්ෂක ජනකාන්ත සැකකරු අත්අඩංගුවට ගත් අවස්ථාවේදී සටහන් කරන ලද ප්‍රකාශය මෙම සාක්ෂිකරු විසින් පරිවර්ථනය කර ඇත. මෙම චූදිතට තමන් විසින් කිසිම බලපෑමක් හෝ තර්ජනයක් නොකළ බව මෙම සාක්ෂිකරු විසින් කියා සිටින ලදී.

උප පොලිස් පරීක්ෂක රාසික් හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ඔහු තිස්සනායගම්ගෙන් කිහිප වරක් ප්‍රශ්න කළ බව පවසා ඇත. එසේ ප්‍රශ්න කිරීමෙන් පසු ඔහු චූදිතගේ ප්‍රකාශයක් සටහන් කර ඇත. චූදිත ඔහුගේ ප්‍රකාශ සටහන් කිරීමෙන් පසු සමහරක් දේ කපා ඉවත් කරන ලෙසට දැන්වූ බවත්, එවිට ඒ කපා හැරි කොටස්වල

ඔහුගේ කෙටි අත්සන යෙදූ බවත් පවසා ඇත. චූදිත වෙනුවෙන් චූදිතට පාපොච්චාරණය කිරීමට සාක්ෂිකරු තර්ජනය කළ බවට යෝජනා කළ විට සාක්ෂිකරු කියා සිටියේ චූදිත උගත් මාධ්‍ය වේදියෙකු බවත්, එවැනි පුද්ගලයෙකුට තර්ජනය කර ඕනෑම දෙයක් ලිවීමට නොහැකි බවත්ය. මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් චූදිත විසින් කරන ලද ප්‍රකාශය මෙම සාක්ෂිකරු ඉදිරියේදී චූදිත විසින් ලියා ඇති බවත්, එම ප්‍රකාශයේ තැන් තැන්වල කපා හැර ඇති කොටස් චූදිත විසින්ම කරන ලද බවත් තහවුරු වන අතර, එහි මුලින්ම වේලාව සටහන් කිරීමක් පමණක් මෙම සාක්ෂිකරු විසින් කර ඇති බව තහවුරු වී ඇත. එම වේලාව සටහන් කිරීමද පසුව යම් කිසි අයකු විසින් වෙනස් කර ඇති බව පෙනී යයි. නමුත් සටහන් කරන ලද වේලාව වෙනස් කිරීම එකී ප්‍රකාශයේ උද්ගත කරුණුවලට බලපාන්නේ නැත.

**උප පොලිස් පරීක්ෂක ඩයස් ජයසුන්දර මින් පසු සාක්ෂි දෙමින්,** ඔහු ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයේ අංශ 3 ට අනුයුක්තව සේවය කරමින් සිටියදී චූදිතට විරුද්ධව පවත්වන ලද විමර්ශණයේදී අංක 0773059503 දරණ ජංගම දූරකථනය සම්බන්ධයෙන් 11.01.2007 වන දින සිට 10.03.2008 වන දින දක්වා ලබා ගන්නා ලද සහ ලැබුණු ඇමතුම් සම්බන්ධයෙන් විමර්ශණයක් සිදු කර ඇත. අධිකරණයෙන් නියෝගයක් ලබා ගැනීමෙන් අනතුරුව චූදිත සන්තකයේ තිබී ලබා ගන්නා ලද එකී සිම්කාඩ්පත සම්බන්ධයෙන් ඩයලොග් ආයතනයෙන් ඇමතුම් සම්බන්ධයෙන් වාර්තාවක් ලබාගෙන ඇත. එය X වශයෙන් ලකුණු කරන ලදී. ඔහු මෙම ඇමතුම් සම්බන්ධයෙන් වගුවක් සකස් කර ඇත. 0212285179 අංකයට එක් වරක් චූදිතගේ දූරකථනයෙන් කතා කර ඇති අතර, චූදිතගේ දූරකථනයට එකී අංකයෙන් 8 වතාවක් මේ කාලය තුළදී

03 SEP 2009



කතා කර ඇත. මෙම සාක්ෂිකරුගෙන් විත්තිය වෙනුවෙන් හරස් ප්‍රශ්න අසා ඇති අතර, ඔහුගේ සාක්ෂිය අභියෝගයට ලක් කර නැත. මෙම සාක්ෂියෙන් චූදිතට කිලිනොච්චියේ යම් කිසි දුරකථනයකින් ඇමතුම් ලැබුණු බවත්, චූදිතද එම දුරකථනයෙන් ඇමතුමක් ලබා දී ඇති බවත් තහවුරු වී ඇත. මෙම සාක්ෂි වලින් සහ එකී දුරකථන සම්බන්ධ වාර්තාවෙන් පෙනී යන්නේ විත්තිකරු කොළඹ ප්‍රදේශයේ පදිංචිව සිටියත්, ඔහු උතුරු ප්‍රදේශය සමඟ සම්බන්ධතා පැවැත්වූ බවයි. මෙම සාක්ෂියෙන් පසු පැමිණිල්ලේ සාක්ෂි අවසන් කරන ලදී.

චූදිත වෙනුවෙන් චූදිත විත්ති කූඩුවේ සිට ප්‍රකාශයක් ඉංග්‍රීසි භාෂාවෙන් කරන ලදී. චූදිත විත්ති කූඩුවේ සිට ප්‍රකාශ කර සිටියේ ඔහුගේ පියා වසර 40 ක කාලයක් රජයේ සේවකයෙකු ලෙස සේවය කළ බවත්, ඔහු කුඩා කල සිට කොළඹ ප්‍රදේශයේ පදිංචිව සිටි බැවින් සියළුම ජාතීන් සමඟ සම්බන්ධතා පැවැත්වූ අතර, ඉංග්‍රීසි භාෂාව ඔහුගේ මුල් භාෂාව ලෙස සලකන බවයි. ඔහුට දෙමළ භාෂාව සම්බන්ධයෙන් එතරම් දැනීමක් නොමැති බවත්, දෙමළ කථා කිරීමට සාමාන්‍යයෙන් හැකි බවත් ප්‍රකාශ කරන ලදී. චූදිත ප්‍රාථමික අධ්‍යාපනයෙන් අනතුරුව පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් දේශපාලන විද්‍යාව සම්බන්ධයෙන් උපාධියක් ලබාගත් බවත්, එහිදිද සෑම ජාතියක් සමඟම මිත්‍රකම් පැවැත්වූ බවත් පවසා සිටින ලදී. 1987 සන්ඩේ ටයිම්ස් ප්‍රවෘත්ති පත්‍ර සමාගමට බැඳුනු බවත්, 1989 මාර්ග ආයතනයේ සේවයට ගිය බවත් පවසමින්, එහිදී සමාජ ප්‍රශ්න ගැන පර්යේෂණ පැවැත්වූ බවත් කියා සිටින ලදී. 1980 දශකයේ අග භාගයේදී රටේ පැවති යුධමය තත්ත්වය නිසා ඔහු වැඩ කළ ආයතනය සමඟ සාම ක්‍රියාදාමයට වැඩකළ බවත්, දකුණේ පැවති ත්‍රස්තවාදය හා උතුරු නැගෙනහිර ප්‍රදේශයේ යුද්ධයත් සම්බන්ධයෙන් ඔහු නොයෙකුත් වාර්තා සකස් කළ බවත්, මෙම

කාලයේදී ශ්‍රී ලංකා රජයට සාමය උදාකර ගැනීම සඳහා උපකාර කිරීමට තවත් පුද්ගලයින් සමඟ මාර්ග ආයතනයේ ඔහු වැඩකළ බවත් කියා සිටින ලදී. අතුරුදහන්වූවන්ගේ මාපිය දූදරු සංගමයේ ඔහු ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස කටයුතු කර ඇත. මෙම සංගමය යටතේ ඔහු දකුණේ අතුරුදහන් වූ අයගේ පවුල්වල විස්තර රැස්කරමින් ඉංග්‍රීසි භාෂාවෙන් ලිපි සකස් කළ බවත්, එම ලිපි විදේශ ආයතනවලට යොමු කළ බවත් කියා සිටින ලදී. ඔහුට රටේ සාමය ඇති කිරීමට තිබූ ආශාව සහ දකුණේ තරුණයින්ට උදව් කිරීමට තිබූ කැමැත්ත නිසා මෙම කටයුතුවල යෙදුනු බවත්, ඔහු ත්‍රස්තවාදී විමර්ශණ කොට්ඨාශයේ නිලධාරීන්ට මේ ගැන පැවසූ බවත්, ඔවුන් ඔහුගේ ප්‍රකාශවල එය සටහන් නොකළ බවත් කියා සිටින ලදී. උප පොලිස් පරීක්ෂක රාසික් ඔහුට පාපොච්චාරණයක් ලිවීමට කියවන විටදී මේ ගැන කිසිවක් සඳහන් නොකළ බවත් කියා සිටින ලදී. මාර්ග ආයතනයේ සේවය කළ කාලයේදී එහි සේවකයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් තමන් සටන් කළ බවත්, ඒ හේතුව මත මාර්ග ආයතනයේ ඔහුට සේවය අහිමි වූ බවත්, මේ සම්බන්ධයෙන් ඔහුට කම්කරු විනිශ්චය සභාවෙන් වන්දි මුදලක් ලැබුනු බවත් කියා සිටින ලදී. ඔහු ඉන්පසුව මීඩියම් නැමති ආයතනයක සේවය කළ බවත්, යුනිසෙෆ් ආයතනයේ ඉල්ලීම් වලට කරුණු සැපයූ බවත්, උතුරු නැගෙනහිර යුද්ධයෙන් අනාථ වූ දරුවන් සම්බන්ධයෙන් ඔහු තොරතුරු රැස්කළ බවත් කියා සිටින ලදී. ඔහු විසින් සෑම ලිපියක්ම ඉංග්‍රීසියෙන් ලියූ බවත්, ඉංග්‍රීසි මාධ්‍යවේදියෙකු ලෙසට සෑමවිටම කටයුතු කළ බවත් කියා සිටින ලදී. ඔහු විසින් ලියන ලද ඉංග්‍රීසි භාෂාවේ ලිපි දෙමළ භාෂාවට පරිවර්තනය කරන ලද්දේ වෙනත් පුද්ගලයෙක් විසින් බවත්, ඔහු පාසැලෙන් පිටවූ පසු දෙමළ භාෂාවෙන් දීර්ඝ වශයෙන් යමක් ලියූ මුල්

03 SEP 2009

අවස්ථාව රාසික් විසින් පවසන ලද පාපෝච්චාරණය ලියූ අවස්ථාව බවත් කියා සිටින ලදී.

රාසික් විසින් පවසන ලද දෙය ඔහු ලියූ බවත්, ඔහුට තනිවම සිතා දෙමළ ලිවීමට හැකියාවක් නොමැති බවත්, එම පාපෝච්චාරණය ඔහු කැමැත්තෙන් කරන ලද්දක් නොවන බවත් කියා සිටින ලදී. රාසික් විසින් ඔහු කියන දේ කලොත් ඔහු මුදාහරින බවත්, ඔහු ලියන දෙය ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කරන බවත්, ඔහු යමක් නිවැරදි කිරීමට තැත්කළ විට රාසික් ඔහුට තර්ජනය කළ බවත් ඔහු කියා සිටින ලදී. ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ ඔහුව අත්අඩංගුවට ගැනීම අසාධාරණ බවත්, 2002 යුධ විරාම ගිවිසුමට පසු උතුරු නැගෙනහිර ප්‍රදේශවලට ගොස් පුද්ගලයින් හමුවීමට අවසර දී තිබූ බවත් කියා සිටින ලදී. මෙම කාලයේදී ඔහු උතුරු නැගෙනහිර ප්‍රදේශවලට ගිය බවත්, එහිදී නොයෙකුත් පුද්ගලයින් සමඟ කථා කළ අතර, උතුරේ දෙමළ නායකයින් සහ එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් හමුවූ බවත්, එල්.ටී.ටී.ඊ. සාමාජිකයින් සමඟ ඔහු මාධ්‍යවේදියෙකු ලෙස කටයුතු කිරීමේදී දුරකථනයෙන් කථා කරන ලද බවත් වූදිත කියා සිටින ලදී. ඔහු බාබා යන අයගෙන් හෝ එල්.ටී.ටී.ඊ. සංවිධානයෙන් මුදල් ලබානොගත් බවත්, North Eastern Monthly සඟරාව මුද්‍රණය කරන ලද්දේ වාණිජමය ලෙස සොයා ගන්නා ලද මුදල් වලින් බවත් කියා සිටින ලදී. සඟරාවේ ඔවුන් ගිණුම් අංක පළකිරීමෙන් පසු ඒ ගැන උනන්දුවක් දක්වන අය මුදල් එවූ බවත්, ඔහු ත්‍රස්තවාදයට සම්බන්ධ පුද්ගලයෙකු නොවූ බවත් කියා සිටින ලදී. අතුරුදහන්වූවන් සෙවීම සඳහා සහ සංගමයේ කටයුතු කිරීම සඳහා ඔහු එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් සමඟ කථාකළ බවත්, වන්නි ප්‍රදේශයේදී මුණගැසුනු බවත්, ඔවුන්ව නම් වශයෙන් දුරකථන සංවාද වලින් දැන

6

නොසිටි බවත් කියා සිටින ලදී. ඔහු විසින් ලියන ලද කිසිම ලිපියක් ඔහු ත්‍රස්තවාදයට උදව් කිරීමට හෝ ඝෝෂණයක් ඇතිකිරීමේ අදහසින් නොලියූ බවත් කියා සිටින ලදී.

චූදිත ඔහුට දෙමළ භාෂාව පිළිබඳව දැනුමක් නොමැති බව කියා සිටියත් ඔහු පාපෝච්චාරණය ඔහුගේ අත් අකුරින් ලියන ලද බව පිළිගන්නා ලදී. යම්කිසි භාෂාවක් ගැන අවබෝධයක් හෝ එකී භාෂාව නොදන්නා පුද්ගලයෙකුගේ අත්අකුරු පරීක්ෂා කිරීමේදී එම පුද්ගලයාට දැනීමක් තිබේද කියා අධ්‍යයනය කළහැකිය. චූදිත විසින් ලියන ලද පාපෝච්චාරණය දෙස බැලීමේදී ඔහුට දෙමළ භාෂාව සම්බන්ධයෙන් දැනීමක් නොමැති බව පිළිගත නොහැකිය. ඔහු උතුරු නැගෙනහිර ප්‍රදේශයේ එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් සමඟ සම්බන්ධයක් තිබූ බවත්, ඔවුන් සමඟ දුරකථනයෙන් නොයෙකුත් අවස්ථාවලදී කථා කළ බවත් ඔහු විසින්ම විත්ති කූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී පිළිගෙන ඇත. ඔහු කියා සිටියේ එසේ ඔවුන් සමඟ සම්බන්ධතා පැවැත්වූයේ යුද්ධයෙන් අනාථවූවන් සහ අතුරුදහන් වූවන්ගේ කටයුතු සඳහා බවයි. නමුත් මින් පෙනී යන්නේ ඔහුට එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් සහ නායකයින් සමඟ සම්බන්ධයක් තිබූ බවයි. ඒ අනුව ඔහු දුරකථනයෙන් කථාකළ එල්.ටී.ටී.ඊ. සාමාජිකයින්ගේ නම් නොදන්නා බව පැවසීම අධිකරණයට පිළිගත නොහැකිය. ඔහු උගත් පුද්ගලයෙක් වන අතර, මාධ්‍යවේදියෙක් වශයෙන් නම නොදන්නා පුද්ගලයින් සමඟ දුරකථන සම්බන්ධතා පැවැත්වූවා යැයි පැවසීම විශ්වාස කළ නොහැකිය.

චූදිත වෙනුවෙන් අතුරුදහන්වූවන්ගේ මාපිය දූදරු සංගමයේ සභාපති ශාක්‍යනන්දන සාක්ෂි දෙමින්, ඔහු මාර්ග ආයතනයේ සේවය කළ කාලයේදී චූදිත තිස්සනායගම් එහි සේවයට පැමිණි බවත්, එහිදී ඔහුව හඳුනා ගත් බවත් කියා සිටින

03 SEP 2009

ලදී. අතුරුදහන්වූවන්ගේ මාපිය දූදරු සංගමය 1990 ආරම්භ කළබවත්, තිස්සනායගම් එයට සම්බන්ධ වී එක්සත් ජාතීන්ගේ සංවිධානයට යවන ලිපි ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කිරීමට විශාල වශයෙන් උදව් කළ බවත්, අතුරුදහන් වූවන් 99% ක් සිංහල තරුණයින් බවත් කියා සිටින ලදී. තිස්සනායගම් දෙමළ භාෂාව නොදන්නා බවත් පවසා සාක්ෂිකරු දීර්ඝ වශයෙන් මාපිය දූදරු සංගමය ගැන විස්තර කරන ලදී. පසුව අවස්ථාවකදී ඔවුන් මීඩියම් නැමති ආයතනයක් ආරම්භ කර ඇති අතර, ඒ මගින් නැගෙනහිර ප්‍රදේශයේ අතුරුදහන් වූවන් සම්බන්ධයෙන් සොයා බලා ඇත. සාම ගිවිසුමෙන් පසු කිලිනොච්චිය සහ යාපනය යන ප්‍රදේශවලටද ඔවුන් ගිය බවත්, එල්.ටී.ටී.ඊ. ය රඳවාගෙන සිටි හමුදා සහ පොලිස් නිලධාරීන් මුදාගැනීමට කටයුතු කළ බවත් කියා සිටින ලදී. මේ සෑම අවස්ථාවකදීම චූදිත ඔවුන්ට සහාය ලබාදුන් බවත් කියා සිටින ලදී. මෙම සාක්ෂිකරු හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, තිස්සනායගම් සිංහල භාෂාවෙන් සහ දෙමළ භාෂාවෙන් ලියන ලද ලියවිලි ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කළ බව පිළිගන්නා ලදී. තවද, ඔවුන් උතුරු නැගෙනහිර ප්‍රදේශවලට ගමන් කළ අවස්ථාවලදී දෙමළ ජනතාව සමඟ චූදිත දෙමළ භාෂාවෙන් කථාකළ බවද පිළිගන්නා ලදී. 2003, 2004 වසර වලදී යාපනයේ මානව හිමිකම් පැමිණිලි ආයතනයක් ආරම්භ කළ බවත්, ඔවුන් එල්.ටී.ටී.ඊ. සංවිධානයට විරුද්ධව ප්‍රකාශ පිළියෙල කළ බවත් කියා සිටියත්, ඉන් එක් ප්‍රකාශයක් හෝ අධිකරණයට ඉදිරිපත් කිරීමට මෙම සාක්ෂිකරුට නොහැකි විය. තවදුරටත් ඔහු හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, ඔහුගේ ආයතනයේ එවැනි ප්‍රකාශයක් දැනට නොමැති බව පිළිගන්නා ලදී. මෙම සාක්ෂිකරු චූදිතගේ North Eastern Monthly සඟරාව කියවා නොමැති බවත්, එහි පාඨකයෙකු නොවන බවත් පිළිගන්නා ලද අතර, චූදිතට විරුද්ධව ඇති චෝදනාවන් සම්බන්ධයෙන් කිසිවක් නොදන්නා බව